
ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත
LP - QD / 52/ News/ 2013

# ළමා ප්‍රදීපය

ක්‍රි. ව. 2013 ජනවාරි 07 සඳුදා
05 වෙළුම - 10 කලබ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු 10.00



## පෙරදිග දී තරුව දුටු ශාස්ත්‍රවන්තයෝ රජව උපන් උතුමාණන් වැදීමට ආහ.

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.lk

# අලුත් වසරක නැවුම් සිතිවිලි

## ආදරණීය දුවේ පුතේ...

2012 වසර ගෙවී ගොස් 2013 නව වසර උදාවුනා. හැම තැනකම, හැම ජීවිතයකම නවතාවයක් ඇති කරවන්නට නව වසරේ හැම දෙනෙක්ම උත්සහ ගත් බවට ගෙවී ගිය දවස් කිහිපය හොඳ සාක්ෂ්‍ය සපයනවා. පුංචි ඔබත් මේ නව සිතිවිල්ලම ජීවිතයේ ඇති කර ගන්න ඇති නේද? පාසලේ අලුත් පංති කාමරයක් , අලුත් පංතියක් අලුත් පොත් පත් එක්ක ඔබත් එක්තරා අන්දමකට අලුත් වෙලා කියලා දැන් ඔබටම තේරෙනවා.

ආදර දුවේ පුතේ,

අපි වයසින් මුහුකුරා යන විට අලුත් අත්දැකීම් ජීවිතයට ලං වෙන කොට අපේ ආධ්‍යාත්මික ජීවිතය තුළත් අලුත් ආරක නව වර්ධනයක් ඇති වන්නටම අවශ්‍යයි. ආගම දහම තුළින් ලබා ගන්නා පෝෂණය, නව දැනුම හා ජීවිත අලංකාරය ජීවිත වල අත් විඳින ආධ්‍යාත්මික හැඟීමත් විශ්වාසය තුළින් වර්ධනය වන්නට ඕනා. නව යහපත් සිතිවිලි සමග මිශ්‍ර වන්නට ඕනා. ගෙවී ගිය වසර තුළ ආධ්‍යාත්මික වශයෙන් අපේ ජීවිතවල සිදුවූ අඩු ලුහුඬුකම්, වැටීම් සහ අඩාල වීම් පිලිබඳව අපට අපේ ශක්ති මට්ටමින් යම් සමාලෝචනයක් අවශ්‍යයි. ඒ නැවත සිතා බැලීම තමයි, අපව නව ආරකින් අපි දිහා , ලෝකය දිහා බලන්නට අපට ශක්තියක් උත්පාද කර දෙන්නෙ.

ඔබ දන්නවා ගෙවුනු වසර තුළදී කෙතරම් හැල හැප්පීම් වලට ලෝකය, සමාජය, අප පරිසරයන් මුහුණ දුන්නාද කියලා. විශාල වශයෙන් මිථ්‍යා විශ්වාසයන් වලට මිනිස් ජීවිත ගෙන යන්නට ගෙවුනු වසරේ බොහෝ අයහපත් ක්‍රියා දාමයන් සිදු වුනා. ලෝක විනාශයක් පිළිබඳව ප්‍රබන්ධයන් ගොතා ඒ ප්‍රබන්ධ විශ්වාස කරවන තත්ත්වයකට මිනිස් ජීවිත රැගෙන යන්නට විවිධ වානිජ මාධ්‍යයන් උත්සහ කළා. ඒ පමණක් නොවෙයි, ජීවිතයේ දහම තුළින් ලැබූ ආධ්‍යාත්මික විශ්වාසය පවා සැක කරවන, අවිශ්වාස තත්ත්වයට ගෙන යන්නට මේ මිථ්‍යා ප්‍රබන්ධ යම් උත්සහයක් ගෙන තිබුනා.

ආදර දුවේ පුතේ, අද අප සමාජයන් පවා මිනිස් ජීවිත වලට යම් භීතියක් ඇති කරවන්නට විවිධ උපකල්පන මත ප්‍රබන්ධයන් මහත් සේ ගෙන එනවා. අලුත් අවුරුද්ද ලබන විටදි විවිධ පුවත්පත් වල ඔබ දකින්න ඇති, නව අවුරුද්ද ඔබට සුබද?. ජ්‍යොතිෂය තුළ ඔබේ ජීවිතය ලග්න පලාපල, නක්ෂත්‍රය යනාදි වශයෙන් විවිධ මිථ්‍යා බලවේග වලට ජීවිතය විනිශ්චය කරන්නට විවිධ පුද්ගලයින් උත්සහ ගෙන තිබූ අයුරු. කිතුනුවන් හැටියට අපි දෙවියන් වහන්සේ තුළ ශක්තිමත්ව ජීවත් වන ජනතාවක් බව ඔබ අමතක කරන්න එපා. ග්‍රහයෙකුට , ලග්න පලාපල වලට , හඳහනකට , ජ්‍යොතිෂ්‍යයට හෝ නක්ෂත්‍රයට අපේ ජීවිත විනිශ්චය කරන්නට බැහැ. මේ මිථ්‍යා බලවේග හා සිතිවිලි වලට වහල් වුනාම අපිත් අන්ධ ජනතාවක් බවට පත් වෙනවා. ඒ අදහස් වලට වේලාව හොඳ හෝ නරක සේ විනිශ්චය කරන්නට බැහැ. දෙවියන් වහන්සේ මැවූ හැම මොහොතක්ම මිනිස් අපට සුබ මොහොතක්. අපේ ක්‍රියාකාරිත්වය තුළ එහි සුබ ඵල අත් දකින්නට හැම මොහොතකම අපට පුළුවන්.

එම නිසා ආදර දුවේ පුතේ, මෙවන් පටු මිනිස් සිතිවිලි වලට ඔබේ ජීවිතය වහල් වෙන්නට ඉඩ දෙන්න එපා. නිවෙස් වල, වතු පිටිවල අපල තත්ත්වයන් උද කරවන්නේ ජීවත් වන අපිමයි. අපේ සිතිවිලි ධාර්මික නොවී නිතරම අඳුරට , සැකයට අපිව ගොදුරු වෙන්නට ඉඩ හරින විට අපි ජීවත් වන නිවසත් පරිසරයත් මූසල බවට පත් වෙනවා. ඒ අපේ ක්‍රියාකාරිත්වය ජ්වලිත නොවී ඇල් මැරුණු තත්ත්වයට පත් වෙන කොටයි. නමුත් කතෝලික අපි නිතරම දේව වචනය තුළ ප්‍රබෝධමත්ව ජීවත් විය යුතුයි. ඒ නවතාවය කතෝලික අපට නිරන්තරයෙන්ම අත් දකින්නට ලැබෙන මහගු දායාදයක්. ආලෝකයේ ඒ දහම තුළ පුංචි ඔබත් නිමග්න වී ජීවත් වන විට අඳුරු සිතිවිලි, පරාජිත සිතිවිලි, මූසල සිතිවිලි දුරින්ම දුරස් වෙන්නට ඕනා. දුරස් කරන්නට ඕනා.

සමහර පටු අදහස් තුළ ජීවත් වන වැඩිහිටියන්ගේ අඳුරු ලෝකයේ පුංචි ඔබ කොටස් කරුවන් බවට පත් වෙන්න එපා. ක්‍රිස්තුන් වහන්සේ තුළ අපි ජීවමාන ජනතාවක් . ලග්න පලාපල වලට අපේ ජීවිත සුබ මොහොත තීරණය කරන්නට ඉඩ දෙන්න අපිට අවශ්‍ය නැහැ. කතෝලික අපි ඒවා විශ්වාස කරන්නෙත් නැහැ. එම නිසා 2013 වසර ආදරයෙන් බාර ගන්න. නැවුම් බවින් පිරී ඉතිරෙන්න. දෙවියන් වහන්සේ තුළ ශක්තිමත් වන්නා හට නැවුම් බවත්, ජීවිත නවෝදයත්, ආලෝකමත් ජීවිත පැවැත්මත් උරුමයි.

අඳුරු මිථ්‍යා මත වලින් බැහැරව, මාධ්‍ය හරහා විවිධ පුද්ගලයන් කරන ග්‍රහලෝක විවාද වලින් බැහැරව, උද වන හැම තත්පරයක්ම සුබ බවට පත් කර ගන්නට අපි විශ්වාසයෙන් තවත් වර්ධනය වෙමු. දහමේ චින්තනයෙන් ශක්තිමත් වෙමු. ඇදහිල්ල වැඩි දියුණු කර ගනිමු. ජීවිත නවතාවයෙන් ශුද්ධාත්ම අත්දැකීම ලබමු. ඒ ශුද්ධාත්ම අත්දැකීම ප්‍රඥාවෙන් , දැනමිතිකමින් , ධෛර්යෙන් හා දේව භයෙන් අපව පුරවන විට පිබිදෙන නවෝදයක අපිත් ආලෝකයේ දරුවන් බවට පත් වෙන බව අමතක කරන්න එපා.

**ලැබුවා වූ නව වසර ඔබට දේව ආශිර්වාදයෙන් පිරුණු නව වසරක් වේවා!**

**ජේසු පිහිටයි.**

සංස්කාරක

ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා

# නව වසරේ ළමා ඔබේ ජීවිතය ලස්සන කර ගැනීමට නම්...

ආදර දුවේ පුතේ,

වසරක් ගෙවී නව වසරක් උදා වෙලා පසුගිය වසරට වඩා සමෘද්ධිමත් වසරක් උදා කර ගැනීම කාගේත් අරමුණයි.

පසුගිය වසරේ දී ඔබගෙන් දැනුවත්ව හෝ නොදැනුවත්ව සිදු වූ වැරදි අඩුපාඩු අවම කර ගන්න පුංචි ඔයාලා හිතට ගන්න. කා අතිනුත් වැරදි සිදුවීම සොබාවිකයි. අප දුර්වල නිසයි ඒ. ඒත් දිගින් දිගටම වැරදි සිදු වීම හොඳ නෑ. තම වැරදි අඩුපාඩු අවම කර ගන්න අප හිතට ගත යුතුයි.

ඔයාලගෙ ජීවිතය පිවිතුරුව ගත කරන්න වෙර දරන්න. "අපගේ ශරීරය ශුද්ධාත්මයාණන්ගේ මන්දිරය " කියා ශුද්ධ වූ සභාව අපට උගන්වනවා.

පුංචි කාලෙ ඉඳන්ම අවංක බව රැකගන්න හිතට ගන්න. වංචා සහගත කිසිවකට ඉඩ තබන්න එපා. මිතුරන් ඇසුරු කිරීමේදී පරිස්සම් වන්න. යම් මිතුරකු තමන්ට නොගැලපෙන බව හැඟෙනවානම් වහාම එම ඇසුරෙන් ඉවත් වන්න.

දෙමාපියන් තම හොඳම මිතුරන් බව හිතට ගන්න. ඔවුන්ට ඔබ මුහුණපාන සෑම දෙයක්ම විවෘතව කියන්න. තම සහෝදර සහෝදරියන් සමඟ කුළුපඟ වන්න. ඔවුන්ගෙන් ජීවිතයට ආදර්ශ ගන්න.

යාච්ඤාව දිනපතා ම කරන්න. පවුල් යාච්ඤාව තම ළමා ජීවිතය ලස්සන කරනවා නොඅනුමානයි. දේව කැඳවීමක් ගැන ඔබට ඉඟියක් දැණුනොත් මුලින්ම දෙමාපියන්ට කියන්න. ඔවුන් මඟින් මීසමේ පියතුමාට කියන්න.

ආදර දුවේ, පුතේ ඔබේ ළමා ජීවිතය "ලස්සන" කර ගැනීමට ඔබට ලැබෙන වැඩි හිටි ඔවදන් පිළිපදින්න.

ඩික්සන් ඇන්ටනි මාමා,

## කුරුකුලාව සාන්ත ලාසරස් විදුහලේ නත්තල් ප්‍රසංගය

කුරුකුලාව සාන්ත ලාසරස් විදුහලෙහි 2012 වාර්ෂික ත්‍යාගප්‍රදානෝත්සවය හා ''බෙත්ලෙහෙම් ගීතය'' නත්තල් ප්‍රසංගය ගරු ප්‍රසාද් පොන්නම්පෙරුම පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි. මෙදින අවස්ථාවක් සේයාරුවෙහි දිස්වේ.

**එච් ඒ කල්දේරා**



## නව වසරට ඇරයුමක්...



සීත සුළඟ ගත දවටා හිනහෙන්නේ
වැහි බිඳු මුතු කැට වීලා අපට පෙනෙන්නේ
නැවුම් බවක් වටපිටාවේ අපට දැනෙන්නේ
නව වසරට අප හට ඇරයුමක් ලැබෙන්නේ

කැලැන්ඩරයේ කොළ ගැලවී ඉවතට යන්නේ
පාසල් වාරේත් යළි එළඹිලා තිබෙන්නේ
පුංචි අපට සතුට අරන් අවුරුදු එන්නේ
නව වසරට අපහට ඇරයුමක් ලැබෙන්නේ

**ඉරේෂා ඈන් පැට්‍රීෂියා මැදගම**
10 ශ්‍රේණිය
ශා. ලුවිස් දහම් පාසල
කොටරූපේ (රද්දොළුගම මීසම)

## බදුල්ල පදවිය

බිබිල ශුද්ධවූ පවුලේ දේවස්ථානයේ දරු දැරියෝ 6 දෙනකු පසුගියදා ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත්හ. දිව්‍ය පූජාවෙන් පසුව මීසම් සේවක ගරු ජූඩ් නිශාන්ත පියතුමන් හා දරු දැරියන් පුහුණු කළ පැවිදි සොයුරිය සමග දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබූ දරු දැරියන් සේයාරුවකට පෙනී සිටි අයුරු. (අෂාන් විල්කන් කෲස්)






## හලාවත පදවිය



නාත්තන්ඩිය මීසමට අයත් දුන්කන්නාව සා. ජූඩ් තදේවුස් මුනි දේවස්ථානයේ ළමෝ 9 දෙනකු පසුගියදා ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබාගත්හ. මීසම්පති ගරු උපාලි චර්චිල්, සහයක ගරු දුමින්ද සුරේෂ් යන පියතුමන් සහ දහම් පාසල් පාලිකා ගරු මොනිකා ප්‍රනාන්දු පැවිදි සොයුරිය සමග දිව බොදුන් ලැබූ ළමුන් සමූහ සේයා රුවකට පෙනී සිටි අයුරු.

(ශ්‍රියාංගණී ෆිලීෂියා)

**මාසික සිතිවිල්ල**



**මාසික සිතිවිල්ල**

"දෙසැම්බර් මාසය" ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.

**ජයග්‍රාහී නිර්මාණය ලබන සතියේ පළ කෙරේ**

## පොල්ගහවෙල දහම් ළමුන්ට ලේඛක වැඩමුළුවක්



කුරුණෑගල පදවියට අයත් පොල්ගහවෙල මීසමේ ලූර්දු දේව මාතා දෙව්මැදුරේ දහම් පාසලේ ඉගෙනුම ලබන ළමුන් සඳහා ළමා ලේඛක වැඩමුළුවක් 2013 ජනවාරි 13 වන ඉරුදින පැවැත්වේ.

දහම් පසලේ 6 වන ශ්‍රේණියේ සිට ඉහල ළමුන් සඳහා පැවැත්වෙන මෙය මෙහෙයවනු ලබන්නේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතාය. ළමුන්ගේ ලේඛක කුසලතා එළිදැක්වීමේ අරමුණින් යුතුව මීසම් සේවක ගරු මනුර ශිරෝන් පියතුමාගේ අනුශාසකත්වය යටතේ මෙය සංවිධානය කෙරේ.



ළමා ප්‍රදීපය කැමරා කාචයේ සටහන් වූ නත්තල් අසිරිය

පරණම්බලම දෙන් බොස්කො ආයතනයේ දරුවන් විසින් පොල්පිතිවලින් නිර්මාණය කර ඉදිරිපත් කර තිබු නත්තල් ගස.

සේයා
බෙන්ජමින් කිරිහෙට්ටි.

# උසස් පෙළ කඩයිම

දහසකුත් වූ
කම්කටොළු මැද
සිතම එක්කළ
සිතුවිල්ල නුඹ......

නිදහසේ ගලාගිය
දඟකාර ළමා වියේ
හසරැල්ල නිමා කළ
නපුරු සිතුවමයි නුඹ ....

මව්පියන්ගේ සතුට
ගුරුවරුන්ගේ පැතුම
මා සිතේ රජ කරවු
පැතුම් සිතුවමයි නුඹ ....

කාලයක් ගෙවී ගොස්
දුටුව රන් විමන් දොර
මා වෙතට ලං කෙරුව
අයිතිකාරයයි නුඹ ...




**අජානි මල්ෂා**
''විමුක්ති නිවස''
මැටියගනේ




## රස දහරා

**ප්‍රකාශනය**
**සා. ජෝශප් නි.ම.නි**
**දෙව්සත්හල කොහුවල,**
**නුගේගොඩ**



කොහුවල සා. ජෝශප් නි.ම.නි. දෙව්සත්හලේ ''සිංහල සාහිත්‍ය දිනය 2012'' වෙනුවෙන් නිකුත් කළ ''රස දහරා'' සඟරාව මා හටද ලැබුණි. ඉතා අගනා ආකර්ශණීය පිටකවරයකින් සැරසුණු මෙහි දෙව්සත්හලේ ඉගෙනුම ලබන ළමුන්ගේ වටිනා නිර්මාණයන්ද අන්තර්ගතය. මොවුන්ගේ විවිධ අවස්ථාවන්හි මතක සටහන් සිහිපත් කරමින් සේයා රූ පිටුද සඟරාවට ගෙනදෙනුයේ ආලෝකයකි.

දෙව්සත්හලෙහි අදියුරු ගරු මැක්සිමස් ප්‍රනාන්දු, පියතුමන්ගේ හා ගරු අසංග විරාජ් ගරු රොෂාන් ප්‍රනාන්දු යන පියතුමන්ලාගේ හා සිංහල විෂය උගන්වන කේ.ඩී. පෙරේරා හා ශාන්ති වීරරත්න ගුරුවරුන්ගේද පණිවුඩ මීට එක් කොට ඇත.

ජ්‍යේෂ්ඨ සිංහල සාහිත්‍ය සංගමයේ සැමටත් මෙයට දායකත්වය සැපයු සියල්ලන්ටත්, ඥානාර්ථ ප්‍රදීපයෙන් ලේඛන කලාවට අත් පොත් තැබු රස දහරා සඟරාවේ ප්‍රධාන සංස්කාරක වශයෙන් කටයුතු කළ ලක්ෂාන් ප්‍රනාන්දුටත් ළමා ප්‍රදීපය සුබ පැතුම්. **කුමර නයනජිත්**




**ඇන්තනි හෙට්ටිආරච්චි විසිනි.**

හංවැල්ල මීසමේ පහත්ගම දහම් පාසල් වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය හංවැල්ල මීසම් සේවක ගරු ගියොම් නෝනිස් පියතුමාගේ ප්‍රධනත්වයෙන් පසු ගිය ද පහත්ගම රෝමානු කතෝලික විදුහල් රංග ශාලාවේදී පැවැත්වුනි.

ගරු ඇනට් පැවිදි සොයුරියගේ මඟ පෙන්වීමෙන් ගරු පැවිදි සොයුරියන් දහම් පාසල් ගුරු මණ්ඩලය සහ දෙමව්පියන් විසින් මෙය සංවිධානය කර තිබුණි. මෙදින අවස්ථාවක් සේයාරුවෙහි දිස්වේ.



# 2013 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

## පාඩම් අංක 01

1. කතෝලික ධර්මය විෂය නිර්දේශය ඉතාම සරලව හඳුනා ගනිමු.

2. මුලින්ම, 10/11 ශ්‍රේණිවල සිසු දරු දැරියන්ට කතෝලික ධර්මය පොත් දෙකක් හඳුන්වාදී ඇති අතර, එයට පදනම් වූ ග්‍රන්ථය වන්නේ , කතෝලික සභා ධර්මෝපදේශයයි.

3. කතෝලික සභා ධර්මෝපදේශය යනු දෙවන වතිකාන මන්ත්‍රණ සභාවෙන් පසුව බිහිවූ විශ්වසයීය ධර්මෝපදේශ ග්‍රන්ථයයි.

4. එය ප්‍රධාන කොටස් හතරකි. එම ග්‍රන්ථයේ ප්‍රධාන කොටස් හතර, (iv) 10/11 ශ්‍රේණිවල ප්‍රධාන තේමා 04 ලෙස සැලකේ.

- ලෝකය තුළ පවතින දේව ක්‍රියාකාරිත්වය
- දේව වරප්‍රසාද ලබා දෙන සක්‍රමේන්තු (දේව ප්‍රසාද නිධාන)
- දේව පනත් පිළිපදිමින් නීතිගරුක හා සදාචාර සම්පන්න ජීවිතයක්
- ක්‍රිස්තියානි යාච්ඤාව

5. 10 ශ්‍රේණිය සහ 11 ශ්‍රේණිය
තේමාව දිව යන්නේ, කතෝලික සභා ධර්මෝපදේශ ග්‍රන්ථයෙහි පළමු කොටස සමගයි. එනම් , ලෝකය තුළ පවතින දේව ක්‍රියාකාරීත්වය යන්නයි.

6. වෙන් වෙන් වශයෙන් පෙළපොත් දෙකක් ලෙස 10 සහ 11 ශ්‍රේණි පෙළපොත් දෙක තිබුණද, අවසානයේ එම පොත් දෙක එක සංකලනයක් සේ පහත මාතෘකා විග්‍රහ කරයි.

- ⋆ දෙවියන් වහන්සේ සහ මැවිල්ල
- ⋆ ආදි පීතෲවරු
- ⋆ ගිවිසුම් සංකල්පය
- ⋆ ඊශ්‍රායෙල් ජනතාවට විමුක්තිය දුන් මෝසෙස්
- ⋆ පුරාණ ගිවිසුම තුළ දේව අනාවරණය
- ⋆ දිවැසිවර දූත මෙහෙවර
- ⋆ නව ගිවිසුමේ දේව පුත්‍රභාවයේ අනාවරණය
- ⋆ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ දූත මෙහෙවර
- ⋆ ජේසුස් වහන්සේව ජීවත් කළ මුල් කිතුනු සභාව
- ⋆ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතය වැළඳගත් සුවිශේෂ චරිත
- ⋆ ශුද්ධ වූ සභාව තුළ අනාවරණය
- ⋆ ශ්‍රී ලාංකීය කිතුනු ඇදහිල්ල

- අපි මෙම පාඩම තුළ 01 තේමාවට පිවිසෙමු.

- දෙවන ප්‍රශ්න පත්‍රයේ පළමු ප්‍රශ්නය අනිවාර්ය ප්‍රශ්නයකි.

ප්‍රශ්න 10 කි. එක් ප්‍රශ්නයකට ලකුණු 02 කි. මුළු ලකුණු 20 කි එම ප්‍රශ්න රටාව පළමුව හඳුනාගනිමු.

ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය 2013 වසරේ දී නව මුහුණුවරක් ගත යුතු යැයි බොහෝ අය කල්පනා කරනවා. 2013 වසරට අධ්‍යාපන අමාත්‍යාංශය ඉදිරිපත් කර ඇති තේමාව වන්නේ ''පළමුව අධ්‍යාපනය'' යන්නයි. එම පැහැදිලි කිරීම තුළ අධ්‍යාපනයට මූලිකත්වය දීමේ වැදගත්කම අප සැමට අවබෝධ වෙයි. ඒ අනුව සාමාන්‍ය පෙළ කතෝලික ධර්මය විෂය නිර්දේශය මෙම කලාපයේ සිට සම්පූර්ණයෙන්ම විභාග ඉලක්ක ස්වරූපයෙන් ඉදිරිපත් කරමු.

**අලගොල්ලෑව ශා. අන්තෝනි මහා විද්‍යාලයේ විදුහල්පති ගරු ඩේමියන් පෙරේරා පියතුමන් විසිනි.**

01. මුල් කිතුනු සභාවෙ තිබුණු නමුත් , එහෙත් නූතන කිතුනු සභාවේ දක්නට නැති ලක්ෂණය ලියන්න.

02. දෙවියන් වහන්සේ පූර්ණ වශයෙන් අනාවරණය වන්නේ කා තුළින්ද?

03. මැවිල්ලට එරෙහිව ක්‍රියාකාරී වීමෙන් ඇතිවන ප්‍රතිඵල දෙකක් ලියන්න.

04. ලන්දේසී පීඩන යුගයේදී මෙරට කතෝලික විශ්වාසය රැකදුන් ධර්මදූත නිකාය නම් කරන්න.

05. දේව රාජ්‍යයේ ලක්ෂණ දෙකක් නම් කරන්න.

06. මිනිසා කිසිම දිනක දෙවියන් වහන්සේ අසරණ නොකරන බව සනාථ කෙරෙන පැරණි ගිවිසුමේ කේන්ද්‍රගත සිද්ධිය නම් කරන්න. (2008/01/01)


07. ''ජීවිතය දෙවියන් වහන්සේගෙන් ඔබ ලබන තිළිණයකි''ශුද්ධ බයිබලයේ මෙම කථා පුවත සඳහන් ග්‍රන්ථය නම් කරන්න. 2008/01/11)

08. ලන්දේසී පීඩන සමයේදී බිඳ වැටුණු කතෝලික විශ්වාසය යළි ගොඩ නැගීමට දායක වූ මිෂනාරි පියතුමන්ලා දෙදෙනකු නම් කරන්න (2008/01/iv)

09. පොළොවෙහි දී පව් කමා කරන්න මනුෂ්‍ය පුත්‍රයාට බලය ඇති බව ඔබ දැනගන්නා පිණිස මම මෙය කරමි'' ඉහත ප්‍රකාශය හා සම්බන්ධ ප්‍රාතිහාර්ය කුමක්ද? (2008/01/v)

10. ජේසුස් වහන්සේ ඉගැන්වූ මෙම ඉගැන්වීම සම්පූර්ණ කරන්න. ''මා ඔබට ප්‍රේම කළාක් මෙන් ඔබත් ..................''

ඉතිරිය 14 පිටුවේ




# වෙන්වීම....

''ඇයි අවලා අඬන්නේ '' කුමුදි ඇසුවේ අවලගේ දෑස් තුළින් පිටතට වැටෙන පුංචි පුංචි කඳුළු බිංදු දුටු විගසයි.

අවලා දහවෙනි ශ්‍රේණියේ ඉගෙනුම ලබන පිය සෙනෙහස අහිමි දැරියකි. ඇය උගත් ගමේ පාසලේ ඇගේ පන්තියේ ඇගේ හොඳම මිතුරිය කුමුදියි. දවසක් පාසල අවසන් වී දෙදෙනාම වෙල්යාය දිගේ නිවෙස් බලා යන අතර මගදී අවලා අඬනු දුටු කුමුදි ඇය සමග කතාවට වැටිණි. ආර්ථික දුෂ්කරතා මධ්‍යයේ දෙදෙනාම හැදීවැඩුනද කුමුදි දෙමාපිය දෙදෙනාගේම ආදරය සෙනෙහස මධ්‍යයේ හැදීවැඩුණු දැරියකි. එහෙත් අවලා කුඩා කල පටන් ඇයට පියා අහිමිය. පිය සෙනෙහස අහිමි වුවත් ඇගේ මව ඇය කුඩා කල පටන් ඇයට ඉතා සෙනෙහසින් ආදරෙන් පියකුගේ අඩුවත් පිරවුවා.

''අනේ කුමුදි අපේ අම්මා රට යන්න යන්නේ. මට උගන්නන්න ඕන නිසා අම්මා රට ගිහින් ගෙයක වැඩට යනවලු . මාව නැන්දලාගේ ගෙදර තියලා යන්න යන්නේ. අනේ කුමුදි මට තාත්තත් අම්මත් දෙන්න-ටම හිටියේ මගේ අම්මා . දැං අම්මා මාව  තනිකරලා ඈතකට යනවා. මට දැන් පාඩම් කරන්න හිතෙන්නෙත් නෑ මේ ගැන හිතෙද්දි අපි ඉන්න ගේ උකස් තියලයි අම්මා රට යන්නේ මං දැං තනි වෙනවා''

හදේ සිරවී තිබුණු වේදනාව තවත් දරාගෙන සිටිමට නොහැකි වුයෙන් හැඬුමත් සමගම මුවින් පිට විය. ''කවදද අම්මා යන්නේ . ආයේ එන්නේ කවදද?'' කුමුදිගෙන් අවලාට ප්‍රශ්න රැසකි.

''හෙට යන්නේ . එන්නේ තව අවුරුදු දෙකකින්''.

''හැමදේම අම්මා කරන්නේ ඔයාගේ හොඳටනේ. අම්මා එහේ ගිහින් හම්බකරන සල්ලි වලින් ඔයාට පොත්, පෑන් , පැන්සල් වගේම තව ඕනකරන ඒවත් එවයි. ඔයා හොඳට ඉගනගෙන විභාගේ පාස් කරන්න. එතකොටයි අම්මට සතුටු . මෙහේ ඔයාට නැන්දයි මායි අපේ අම්මයි තාත්තයි ඉන්නවනේ''. අවලාගේ වේදනාබර හදවතට පුංචි සැනසුම් වදනක් කුමුදි එක් කළාය. දෙදෙනාගේම කතාව අතරමග නතරකරන්නට සිදු වුයේ දෙ-දෙනාටම නොදැනීම අවලාගේ නිවස ලගට ළඟා වු නිසාය. අවලා නිවසට යෑමට සැරසෙත්ම කුමුදු ඇගේ අත අල්ලා ඇයට මෙසේ පැවසීය.

''ගෙදර ගිහින් ඔයා ගැන හිතලා හිත කලබල කරගන්න එපා. පාඩම් කරන්න හොඳට තව අවුරුද්දයි විභාගෙට.'' මෙසේ පවසා කුමුදු යාමට සැරසුනී. ඇයට සමුදී අවලා නිවස වෙතට පැමිණියාය. ඇයට දැක ගැනීමට ලැබුණේ රැගෙන යාමට අවශ්‍ය සියල්ල අතරට ඇගේ පුංචි බෝනික්කත් දමාගෙන බෑග් සියල්ල මව ඇසුරුම් කර ගන්නා අයුරුය. ඇය පාසල් නිල ඇඳුම පිටින්ම මව තුරුළට දිව ගොස් මව බදාගෙන හැඬුවාය.

''අනේ මගේ පුතේ අඬන්න එපා රත්තරනේ. ඔයා ඔහොම ඇඬුවොත් අම්මා කොහොමද හෙට යන්නේ. නාඩා ඉන්න මගේ පුතේ. දැං හොඳ ළමයා වගේ කාලා එන්න. ඔය ඇඳුමත් ජරා වෙයි. ඕක ගලවලා කන්න. මං ඔයාට සල්ලි එවන්නම් ගියාම ඔයා නැන්දට කියලා තව ගවුමක් මස්ස ගන්න හොඳේ.'' ඇයට කෑමක් ඕනෑ නොවීය. හිත තුළ තෙරපෙන්නේ මවගේ ඇත්විමයි. ඇයට බඩගින්නක්ද නොවීය. එදින ඇගේ හැසිරීම සොහොන් පළක හැසිරෙන හොල්මනක් මෙන් විය. කිසිවක් ඕනෑ කමින් නොකළාය. එදින රාත්‍රියේ ඇයට නින්දක් නොවීය.  හෙට දින මව ඇගෙන් ඈතටම යන බව චිත්‍ර රූප මගින් මවා ගත් ඇය  දෑස් පියා ගත්තද විටින් විට දෑස් විවර කර මවගේ තුරුළට ලං විය. පසු දින ඇය දෑස් විවර කර අවට බැලීමෙදි දැක ගන්නට හැකිවුයේ මව ළඟ නැති බවයි. එකවර තිගැස්සි නැගිට ''අම්මා'' 'අම්මා'' කියා සාලය වෙත දුව ගියාය. ඇය යන අතුර තුර මව චාම් ඔසරියකින් සැරසී යෑමට සැරසෙන බව ඇයට දැකගැනීමට හැකි විය. ඇගේ නෙත ගියේ මිදුල දෙසටය , කොළ පැහැති ත්‍රිවිලයක් මිදුලේ නවතා තිබුණු දුටු ඈට සියල්ල එක නිමේෂයකින් බොඳවී යන බව හැඟිනි.

''පුතේ මං යනවා. නැන්දා කියනදේ අහගෙන හොඳ ළමයෙක් වගේ ඉන්න. මං ටික දවසකින් සල්ලි කීයක්හරි එවන්නම් ඔයා පොත් අරගන්න.'' මෙසේ පවසා තම ලයට ඇයව තුරුලු කරන් ඇය දෙස ඉතා සෙනෙහසින් යුතු දෑසින් බලා යෑමට සූදනම් විය. අවලා තම මවගේ දෙපා නැමැද මවගේ තුරුලට ගොස් ඇය වැළඳ ගත්තාය. පසුව තම සොහොයුරියත් මෙන් තමාගෙ උප කාරයට හැමදම සිටින ඇගේ ස්වාමියාගේ නැගණිය ට අවලාව බාරදී ඇයටත් සමු දී. ත්‍රිවිලයට නැග්ගේ, දුව ඉදිරියේ හඬා වැලපී කියා ගත නොහැකි මව් සෙනෙහසක වේදනාවෙන් තැලි පොඩිවී ඇති ඇගේ මටසිලුටු හදවතේ ඉඩෝර ගලන වේදනාව දෑසින් ජල බිංදු මෙන් රූරා වැටෙන ඒ විශාල කඳුළු බිංදු පිසදමමිණි. මවගේ වෙන්වී යාම දෑස් නොපියා ඇහි පිල්ලක් වත් නොග සා බලා සිටියේ නිසිදාක නොදැනුණු තනිකමක් පාළුවක් දුරස්ත බවක් හදේ සිරකරගෙනය. මවගේ වෙන්වී යාමට ගත වුයේ එක නිමේෂයකි. ජිවිතේ අසුන්දර මතකයන් අතරට මවගේ වෙන්වී යාමත් අවලා සටහනක් කර ගත්තීය. පසු දින අවලාත් කුමුදිත් වෙනදා මෙන් උදෑසනම පාසල් යාමට වෙල් යායේදී එකතු විය. සුපුරුදු පරිදි දෙදෙනාම පාසල් ගොස් අධ්‍යාපන කටයුතු වල නියැලුනේය.

**නවංජනී තාරිකා ප්‍රනාන්දු**
13 ශ්‍රේණිය
හලා/ වෙන්/ දංකොටුව  බාලිකා මහ විදුහල - දංකොටුව

# රජතුන් කට්ටුවේ මංග

**ජනවන්දනා වසරේ ප්‍රීතිමත් හා ආනන්දජනක කාලසීමාවක් ලෙස සැලකෙන නත්තල් මංගල්‍යය හා නත්තල් සමය සති 02 ක කාලසීමාවක් පුරාවට ම විහිදී තිබෙන අතර නත්තල් සමය, අවසන් වන්නේ රජතුන් කට්ටුවේ මංගල්‍යය හෙවත් දිව්‍ය බිළිඳාණන් ලොවට ප්‍රත්‍යක්ෂ වීමේ මංගල්‍යයෙනි.**

මෙම මංගල්‍යය නත්තල් මංගල්‍යයට වඩා ඉපැරණි ඉතිහාසයක් පවතින අතර පෙරදිග කතෝලික සභාවත් නත්තල් මංගල්‍යයට වඩා ඉතාමත් උත්සවශ්‍රීයෙන් සමරනු ලබන්නේ මෙම රජතුන් කට්ටුවේ මංගල්‍යයයි. සාමාන්‍ය දින ගණන් කිරීමට අනුව නත්තල් සමය දින 12 කට සීමා වුවත්, දෙවන වතිකාන මන්ත්‍රණ සභාවෙන් පසුව ශු. පවුලේ මංගල්‍යයට පසු ඉරුදින මෙම මංගල්‍යය සැමරීමට නියෝග කෙරිණි. රජතුන් කට්ටුව එසේ නොමැතිනම් ශාස්ත්‍රවන්තයින්ගේ මංගල්‍යය යනුවෙන් අදහස් කරන්නේ මතෙව්තුමාගේ සුභාරංචියට අනුව ජේසු සමිඳුන් බෙත්ලෙහෙමේ උපන් අවස්ථාවේදී පෙරදිගින් ශාස්ත්‍රවන්තයෝ තිදෙනෙක් පෙරදිග අහසේ පෑයු තාරකාව දෙස බලාගෙන ජුදාදේශයේ ජෙරුසලමට පැමිණ, හෙරෝද් රජුට එපවත් දන්වා , දිවැසිවර ඉගැන්වීම් අනුව බෙත්ලෙහෙමට පැමිණ ජුසේතුමන් හා මරියතුමී සමඟ සිටි දිව්‍ය බිළිඳාණන් වෙත පසඟ පිහිටුවා වැඳ නමස්කාර කරන ලද සිද්ධියයි.

මෙලෙස පැමිණි ශාස්ත්‍රවන්තයින්ගේ නාමයන් මෙසේය. ගස්පාර්, මෙල්කියෝ සහ බල්තසාර්ය, ජනප්‍රවාදයට අනුව මෙම ශාස්ත්‍රවන්තයින් තිදෙනා දිසා තුනකින් පැමිණි බව සඳහන්වේ. ඒ යුරෝපයෙන් ද, අප්‍රිකාවෙන් හා ආසියාවෙන් ය. මේ සිද්ධිය තුළින් දිව්‍ය බිළිඳුණෝ විශ්වයේ ම රජාණන් බව ඉඟිකෙරේ. මේ තිදෙනා රැගෙන ආ පඬුරු අතර වුයේ රන්, තුවරලා සහ ගන්ධරසය වේ. ඒවාහි ද ප්‍රබල අර්ථ ඇත. එනම් රන් තුළින් දේව පුත්‍රයාණන්ගේ රාජකීයත්වය පෙන්නුම් කරයි. තුවරලා නොහොත් කට්ටකුමන්ජල්



**රජතුන් කට්ටුව එසේ නොමැතිනම් ශාස්ත්‍**
**අදහස් කරන්නේ මතෙව්තුමාගේ සුභාර**
**බෙත්ලෙහෙමේ උපන් අවස්ථාවේදී**
**තිදෙනෙක් පෙරදිග අහසේ පෑයු තාරකා**
**ජෙරුසලමට පැමිණ, හෙරෝද්**
**දිවැසිවර ඉගැන්වීම් අනුව බෙත්ලෙහෙමට ප**
**සිටි දිව්‍ය බිළිඳාණන් වෙත පසඟ පිහිටුවා**
**මෙලෙස පැමිණි ශාස්ත්‍රවන්තයි**
**ගස්පාර්, මෙල්කියෝ සහ බල්තස**
**මෙම ශාස්ත්‍රවන්තයින් තිදෙනා දිසා තු**
**ඒ යුරෝපයෙන් ද, අප්‍රිකාවෙ**
**මේ සිද්ධිය තුළින් දිව්‍ය බිළිඳුණෝ විශ්ව**

# ලයය

(සුවඳදුප) තුළින් දේව පුත්‍රයාණන්ගේ අග්‍රපූජක ධූරය පෙන්වා දෙයි. ගන්ධ රසයෙන් අරුත් ගන්වන්නේ දිවැසිධුරයයි. මෙලෙස දිව්‍ය බිළිඳාණන් ලොවට ප්‍රකාශ වීමේ හෙවත් රජතුන් කට්ටුවේ මංගල්‍යය තුළින් ශු. සභා මාතාව අප සැම කැඳවන්නේ දේව බිළිඳාණන් එදා ලෝකයාට ප්‍රකාශ වුණ අන්දමින් ම අප ද ලෝකය තුළ පවනක් , ආලෝකයක්, ලෙස ක්‍රියාකිරීමටය. පෙරදිග සභාවන්ට අනුව මෙම මංගල්‍යය දේව දර්ශනයේ මංගල්‍යය ලෙස අරුත් ගන්වා ඇත.

**ත්‍රවන්තයින්ගේ මංගල්‍යය යනුවෙන්**
**ර්ංචියට අනුව ජේසු සමිඳුන්**
**පෙරදිගින් ශාස්ත්‍රවන්තයෝ**
**ව දෙස බලාගෙන ජුදාදේශයේ**
**රජුට එපවත් දන්වා ,**
**ැමිණ ජුසේතුමන් හා මරියතුමී සමඟ**
**වැඳ නමස්කාර කරන ලද සිද්ධියයි.**
**න්ගේ නාමයන් මෙසේය.**
**ර්ය, ජනප්‍රවාදයට අනුව**
**නකින් පැමිණි බව සඳහන්වේ.**
**් හා ආසියාවෙන් ය.**
**යේ ම රජාණන් බව ඉඟිකෙරේ.**



රෝමානු කතෝලික පිළිවෙත් වලට අමතරව පෙරදිග සභා වල මෙම මංගල්‍යය ට ආවේනික පිලිවෙත් රාශියක් තිබෙන අතර පෙරදිග ඕර්තඩොක්ස් සභාව, කොප්පින , රුසියානු යනාදි සභාවන් වල මේ මංගල්‍යය ඉමහත් උත්සවශ්‍රීයෙන් සමරනු ලැබේ. සභා පියවරුන්ට අනුව මෙම මංගල්‍යය ක්‍රි.ව. 107 දී ශු. අන්තියෝකියේ ඉග්නාසියුස්තුමා විසින් ආරම්භ කරන ලද බව කියැවේ.

කෙසේ වෙතත් සමස්තය ගත් කල දෙව්බව උතුම්කම පසෙකලා අප හා සමාන මිනිස් කෙනෙකු වූ දේව පුත්‍රයාණෝ මෙලොව මාංශගතවී, මෙලෝ සියලු දෙනා ආගම් ජාතින්, රටවල්, සංස්කෘතින් වෙත උදාකළාවූ ඒ උත්තරීතර ගැලවීමේ හා විමුක්තියේ මාර්ගය වෙත ජනතාව යොමුකිරීමට හා කැඳවීමට මේ මංගල්‍යය විශේෂයෙන් අප සැම කැඳවනු ලබයි. තවද ඉපැරණි ලාංකේය කතෝලික සිරිත් විරිත් අතර මේ මංගල්‍යය අරභයා සිදු කරන ලද සිරිත් විරිත් බොහොමයක් ඈත අතීතයේ සිටම පැවතුණි.

ඒවා අතුරින් තවමත් ඉතිරි වී තිබෙන දෙයක් ලෙස නත්තලට අප නිවෙස් වල සරසනු ලැබූ ගවලෙන හා නත්තල් ගස් ඉවත් කරනු ලබන්නේ මෙම මංගල්‍යයට පසුවය. තවද ඉපැරණි සිරිත් විරිත් අතර මේ මංගල්‍යය අරභයා කතෝලික ගම්මාන රාශියක් නාට්‍ය හා නාඩගම් පවත්වා ඇත. ඒ අතුරින් පළමු සිංහල නාඩගම වන්නේ ද රජතුන් කට්ටුවේ නාඩගමයි. එය මුලින්ම දමිළ බසින් යාපන අර්ධද්වීපයෙන් ආරම්භ වූ අතර සිංහල පළමු නාඩගම හලාවතින් ද පසුව දූවේ ද විකාශනය වුණි. අදත් මෙම ඉපැරණි රජතුන් කට්ටුවේ නාඩගම දූවේ රඟදක්වනු ලැබේ.

**අසේල දසනායක**



# ඉංග්‍රීසි පාඩම විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා

ඉදිරිපත් කිරීම මයිකල් ඇන්ජලෝ ප්‍රනාන්දු විසිනි.

පාඩම් අංක : 81

## (03) Prepositions වරදවා යෙදීම.

නිවැරදි ඉංග්‍රීසි භාවිතා කිරීමේදී අපිට Prepositions (නිපාත) නිවැරදිව යෙදීම අත්‍යවශ්‍ය වෙනවා. ඒත් බොහෝ දෙනෙක් වැරදි නිපාත පද (Prepositions) යෙදීම අපිට බහුලව දකින්න ලැබෙන දෙයක්. අපි නිපාත පද ගැන බොහෝ දේ ඉගෙන ගත්තා.

අපි ඉතා සුලභ ලෙස වැරදියට යොදන නිපාත පද කීපයක් සලකා බැලීමෙන් ඒවා නිවැරදිව යොදන හැටි ඉගෙන ගනිමු. මුලින්ම වැරදි යෙදීමත්, ඊට යටින් නිවැදි යෙදීමත් පහතින් සඳහන් වෙනවා. නිවැරදි වැකියට "correct" යන අදහස (c) අකුරත්, වැරදි වැකියට "wrong" කියන අදහස (w) අකුරත් යොදා තිබෙනවා. මෙයින් නිවැරදි නිපාත පද යෙදීම ප්‍රවේසමින් ඉගෙන ගෙන නිවැරදිව භාවිතා කිරීමට ප්‍රවේසම් වෙන්න.

1. (w) Nimal is afraid <u>by</u> dogs ✗ - නිමල් බල්ලන්ට බයයි.
(c) Nimal is afraid <u>of</u> dogs ✔- (නිමල් ඉස් එෆ්‍රේඩ් ඔෆ් ඩෝග්ස්)

2. (w) This man is blind <u>in</u> one eye.✗ - මේ මිනිහා එක ඇහැක් අන්ධ කෙනෙක්. (c) This man is blind <u>of</u> one eye. ✔ - (දිස් මැන් ඉස් බ්ලයින්ඩ් ඔෆ් වන් අයි.)

3. (w) Every man has sinned <u>to</u> God. ✗ හැම මිනිහාම දෙවියන් වහන්සේට විරුද්ධව පව් කර තියෙනවා (c) Every man has sinned <u>against</u> God. ✔ - (එව්රි මැන් හැස් සින්ඩ් එගේන්ස්ට් ගෝඩ්.)

4. (w) He ran away <u>by</u> seeing a tiger. ✗- ඔහු කොටියෙක් දැකල දිව්වා. (c) He ran away <u>on</u> seeing a tiger ✔- (හී රැන් එ වේ ඔන් සීං අ ටයිගර්)

5. (w) Such conduct is unworthy <u>for</u> you.✗ - ඒ විදිහෙ හැසිරීමක් ඔබට උචිත නෑ. (c) Such conduct is unworthy <u>of</u> you ✔ - (සච් කන්ඩක්ට් ඉස් අන්ව(ර්)දි ඔෆ් යූ.)

6. (w) My friend is offended <u>against</u> me. ✗ - මගේ මිතුරා මා එක්ක අමනාපයෙන්. (c) My friend is offended <u>with</u> me. ✔ - (මයි ෆ්‍රෙන්ඩ් ඉස් ඔෆෙන්ඩ් විත් මී.)

7. (w) Kamala is attentive <u>at</u> her studies. ✗ කමලා ඇගේ ඉගෙනීම් කටයුතු වෙත අවධානයෙන් වැඩ කරනවා. (c) Kamala is attentive <u>to</u> her studies ✔ . (කමලා ඉස් අටෙන්ටිව් ටු හ(ර්) ස්ටඩීස්)

8. (w) I have no faith <u>upon</u> this man. ✗- මට මේ මිනිහාව විශ්වාස නෑ. (c) I have no faith <u>in</u> this man. ✔ - (අයි හැව් නෝ ෆේත් ඉන් දිස් මැන්)

9. (w) He succeeded <u>to win</u> her consent. ✗
ඔහු ඇගේ කැමැත්ත දිනාගත්ත. කැමැත්ත ලබා ගැනීමේ අදහස සාර්ථක කරගත්තා (c) He succeeded <u>in winning</u> her consent. ✔- (හී සක්සීඩඩ් ඉන් විනිං හ(ර්) කන්සෙට්.)

10. (w) The title of knight was conferred <u>to</u> him.✗ ඔහුට නයිට් පදවියක් පිරිනමනු ලැබුවා. c) The title of knight was conferred <u>upon</u> him.✔ - (ද කන්ෆ(ර්)ඩ් අපොන් හිම්)

11. (w) He set on fire <u>to</u> the hayrick. ✗ ඔහු ගොයම් කොළේ (ගොයම් ගොඩ) ගිනි තිබ්බා. (c) He set fire to the hayrick - (හී සෙට් ෆයර් ටු ස හේරික් ) **(නැතිනම්)** He set the hayrick on fire - ✔ හී සෙට් ද හේරික් ඔන් ෆය(ර්)

12. (w) He arrived <u>to</u> a conclusion.✗ - ඔහු තීරණයකට එළඹුනා.
(c) He arrived <u>at</u> a conclusion. ✔ - (හී අරයිව්ඩ් ඇට් අ කන්ක්ලූෂන්.)

13. (w) He built a public library <u>by</u> his own expense. ✗
ඔහු ඔහුගේ වියදමෙන් පොදු පුස්තකාලයක් හැදුවා.
(c) He built a public library <u>at</u> his own expense. - ✔
(හී බිල්ට් අ පබ්ලික් ලයිබ්‍රරි ඇට් හිස් ඔන් එක්ස්පෙන්ස්)

14. (w) <u>By</u> hearing his statement we were <u>too much</u> surprised. ✗
ඔහුගේ ප්‍රකාශය අහල අපි ගොඩක් පුදුම වුණා.
(c) <u>On</u> hearing his statement, we were <u>very much</u> surprised. ✔
(ඔන් හියරිං හිස් ස්ටේට්මන්ට්, වී ව(ර්) වෙරි මච් සප්‍රයිස්ඩ්)

15. (w) Is it true that you have a dislike **against** geography? ✗

ඔබ භූගෝල විද්‍යාවට අකමැතියි කියන්නෙ ඇත්තද?
(c) Is it true that you have a dislike <u>**to**</u> geography? ✔
(ඉස් ඉට් ට්‍රෑ ඇට් යූ හැව් අ ඩිස්ලයික් ටු ජියෝග්‍රෆි?)

## මුද්දර ලෝකය



## හඳුනා ගනිමු

# මුද්දර දැනුම විෂය බද්ධ කරමු.

ලොවේ නොයෙකුත් රටවල් මගින් විවිධ වූ අවශ්‍යතාවයන් උදෙසා විවිධ වූ තේමාවන් යටතේ විචිත්‍රවත් මුද්දර නිකුත් කරනු ලබයි. ඒ අනුව යම්කිසි රටක ඉතිහාසය, භූගෝලයප, සොබා සෞන්දර්යය , ක්‍රීඩා දේශපාලනය, සංස්කෘතිය, කලාව හා අදාළ රටට ආවේනික මල්, සතුන්, කුරුල්ලන්, සමනලුන්, මත්සයන් ඇතුළු බොහෝ කරුණු කාරණා මුද්දර මගින් එළිදක්වයි. එමගින් අපට දැනුම් සම්භාරයක් කුඩා මුද්දරයකින් ලබා ගත හැකිය. මෙම කරුණු සලකා බැලීමේදී රටක සැබෑ පුවත් පිළිබිඹු කරවන පුවත් මාධ්‍යය - සංනිවේදන මෙවලම - කොටින්ම රටක කැඩපත මුද්දර යයි. කිවහොත් වඩාත් නිවැරදිය.

අන්තර්ජාල පහසුකම් ලබාගැනීමට නොහැකි - විශ්ව කෝෂයක් පරිහරණය කිරීමේ අවස්ථාවක් නොමැති මධ්‍ය පාංතික දරුවකුට වුවද මුද්දර එකතුවකින් ලබාගත හැකි දැනුම ලබා ගැනීම සඳහා බෙහෙවින් ඉවහල්වේ. වර්තමානයේ බොහෝ පාසල්වල මුද්දර සමිති සමාගම් මුද්දර ප්‍රදර්ශන මුද්දර දේශන - සම්මන්ත්‍රණ - වැඩමුළු සංවිධාන කිරීමේ ප්‍රවනතාවයක් දක්නට ලැබෙන්නේ ඒ හේතුවෙන්ය.

''ළමා ප්‍රදීපය' පාඨක සමාජයේ දරු දැරියනට පාසලේ ඉගෙනගන්නා විෂයන්ට තම මුද්දර දැනුම ආදේශ කරගන්නා ආකාරය - අදාළ විෂයයනට බද්ධ කිරීම පහදා දීමේ අරමුණින් ය. මෙම ලිපිපෙළ සකස් කෙරෙන්නේ. ඒ සඳහා මුලින්ම අපි ලංකාවේ භාවිතවන මුද්දර වර්ග පිළිබඳව මූලික දැනුමක් ලබා ගනිමු.

අප රටේ ප්‍රධාන වශයෙන් තැපැල් මුද්දර හා ආදායම් මුද්දර යනුවෙන් වර්ග දෙකකින් මුද්දර නිකුත් කෙරේ දැනට රටේ භාවිතාවන මුද්දර වල වටිනාකම අනුව සත. 50 සිට රු. 2000/= දක්වා වූ මුද්දර තැපැල් හා ආදායම් මුද්දර ලෙස භාවිතයට ගැනේ. එයින් රාජ්‍ය ලාංඡනය සහිත මුද්දර භාවිතවන්නේ ආදායම් කටයුතු සඳහාය.

ඒ අතර තැපැල්මුද්දර ප්‍රධාන වශයෙන් වර්ග හතරකි. ඒවානම් 1. ස්ථිර කාණ්ඩයේ මුද්දර 2. සමරු මුද්දර 3. විශේෂ මුද්දර 4. අති මුද්‍රණ මුද්දර

★ ස්ථිර කාණ්ඩයේ මුද්දර - මෙවා නිත්‍ය කාණ්ඩයේ මුද්දර - ස්ථිර නිකුතු - නියත මුද්දර යනුවෙන්ද හැඳින්වේ. මෙරට එදිනෙදා සාමාන්‍ය තැපැල් කටයුතු සඳහා භාවිතයට ගැනෙන්නේ මෙවැනි මුද්දරය. මෙම මුද්දර දීර්ඝ කාලයක් රට තුළ පාවිච්චියට ගැනේ. බොහෝ විට මේවා කාණ්ඩ වශයෙන් විටින් විට නැවත නැවතත් මුද්‍රණය කර නිකුත් කරනු ලබයි. දැනට කලකට ඉහතදී අප රටේ නිකුත් කළ රුපියල් එකක වටිනාකමින් යුත් නිල් පැහැති ''නිල් මානෙල් ''මල (ජාතික පුෂ්පය ) මෑතකදී නිකුත් වූ රු 2/= වටිනාකමින් යුත් එම පැහැති ''උඩරට නැට්ටුවා''දැක්වෙන මුද්දරය හා රු.5/= වටිනාකමින් වූ නිල් පැහැති ''නීල මාණික්‍ය'' (ජාතික මැණික) හා වත්මනේ දැනට භාවිත වන රු. 5 /= ක වටිනාකමක් ඇති දුඹුරු පැහැයෙන් යුත් ''තුලා රාශිය'' දැක්වෙන මුද්දර මෙම කාණ්ඩයේ මුද්ද ලෙස හැඳින්වේ.

✍ සිරිල් පෙරේරා

# රචනා ලිවීමට දක්ෂ දියණියක්

''කාදිනල් තෝමස් කුරේ හිමිපාණන් ගේ ගමන්මඟ'' තේමාව යටතේ කොළඹ අගරදගුරු පදවි ධර්මෝපදේශ මධ්‍යස්ථානය හා තෝමස් කාදිනල් කුරේ අනුස්මරණ කමිටුව මගින් සංවිධානය කරන ලද රචනා තරගයෙන් වසය 18 න් පහළ තරාල සිරිකුරුස දහම් පාසලේ 2012 වසරේ අ.පො.ස. සාමාන්‍ය පෙළට පෙනී සිටි, නයනා දිල්හානි ශිෂ්‍යාව දෙවන ස්ථානය ලබා ගුරුබැවිල දිසාවට මෙන්ම තරාල මීසමට ද ඉමහත් කීර්තියක් ලබා දුනි.



නයනා දිල්හානි

ගුරුබැවිල දිසා දහම් පාසල් අධ්‍යක්ෂ , තරාල මීසම් සේවක ගරු සුමිත් රෝෂන් රුදීගු පියතුමාගේ ආශිර්වාදයෙන් සහ මඟ පෙන්වීමෙන් 11 ශ්‍රේණියේ දහම් ගුරු මහත්ම මහත්මීන්ගේ දිරි ගැන්වීමෙන් නයනා දිල්හානි ශිෂ්‍යාව ලද ජයග්‍රහණයේ පදක්කම සහ සහතික පත පසුගියදා තේවත්ත බැසිලිකා පුදබිමේදී අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ සුරතින් ලැබීය.

සමන්කාන්ත සිල්වා.

# 2012 වසරේ පැවැත්වූ නිර්මාණකරන වැඩමුළුවන් හි ජයග්‍රාහී නිර්මාණ නොවූ සාර්ථක සිතුවම්

පුංචි අපේ චිත්‍ර පිටුව



**හෂානි කුමුදු මාලි**
11 ශ්‍රේණිය
සිරිකුරුස දහම් පාසල
මුන්නක්කරය
(මහවිදිය මීසම )

**සචින් ඉෂාර**
9 ශ්‍රේණිය
ශු. අන්තෝනි මුනිඳු දහම් පාසල
බණ්ඩාරහේන
(රාජකදළුව මීසම )





**අරුනි කෞෂල්‍යා**
7 ශ්‍රේණිය
සා. ජෝශප් ශාඛා පාසල
මීගමුව



**නිමේෂා හර්ෂනි**
7 ශ්‍රේණිය
ශු. මිඛායෙල් දහම් පාසල
නාගොඩ - කළුතර

පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම, පංතිය, පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.
"පුංචි අපේ චිත්‍ර පිටුව"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.



**සතිනි උපේක්ෂා**
6 ශ්‍රේණිය
සා. තෙරේසා දහම් පාසල
තල්විල



**රශ්මි මලීෂා ජයවීර**
6 ශ්‍රේණිය
සුරදූතික බාලිකා
අපේක්ෂාවේ පාසල
පයාගල



## සුදුවර චරිතයක් හඳුනාගනිමු

# ශු. ඇග්නස් මුනිවරිය

ක්‍රි.ව. 2 වන සියවසේ විසූ ප්‍රාණ පරිත්‍යාගින් අතර තරුණ වියේදී ම ප්‍රාණපරිත්‍යාග කිරීටය හිමිකරගත් ශුද්ධවතුන් අතුරින් ශු. ඇග්නස් මුනිවරියට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. වැලේරියානු අගරජ සමයේ විසූ ඇය කුඩා කල සිටම දෙවි මහෝත්තමයාණන් කෙරේ දැඩි ගැඹුරු විශ්වාසයකින් ද, මයීදාවයෙන්ද පිරිසිදු ජීවිතයක් ගත කළාය.

එතුමිය පිළිබඳ ඇතැම් ඉතිහාස දත්ත සැක සහිත වුවත් එතුමිය රෝමයේ ජීවත්වූ බවට නිසැකවම ඉතිහාසඥයෝ කරුණු ඉදිරිපත් කරති. ඇගේ වයස අවු. 16 වන විට තම උපන් දිනය සැමරූ අවස්ථාවේදී තම දෙමාපියන් කැටුව දිව්‍ය පූජාවට සහභාගි වී දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගෙන රදගුරුතුමන් පාමුල දණින් වැටී තම මුළු දිවියම, ජේසු සමිඳුන්ට තිළිණයක් කොට, කන්‍යාවක ලෙස දිවි ගෙවන බවට ප්‍රතිඥාවක් ද භාරයක්ද වූවාය.

එදිනම සවස රෝමානු ආණ්ඩුකාරවරයාගේ පුත්‍රයා ඇය විවාහ කර ගැනීමේ අදහසින් ඇයට වටිනා තෑගි එවූ අතර, ඒවා සියල්ලක්ම ප්‍රතික්ෂේප කළ ඇය ''ස්වර්ගීය රජාණන් වහන්සේගේ පුත්‍රයාණන් වන ක්‍රිස්තුන් වහන්සේ හා මම විවාහ ගිවිස ගෙන සිටිමියි' අභීතව පැවසුවාය.

මේ පිළිබඳව දැඩි ලෙස කෝපාවිෂ්ට වූ ආණ්ඩුකාරවරයාගේ පුත්‍රයා ඇය සිරභාරයට ගත් අතර රෝමානු සොල්දාදුවෝ දැඩි ලෙස අවඥා සහගතව සිරගෙට ඇදගෙන ගොස් එහිදී බොරු මිථ්‍යාදෘෂ්ටික දේවතා රූප වලට මල් සහ දුම් පිදීමට බල කර නොයෙක් වද හිංසා කරමින් හිරිහැර කර සිටියෝය.

ඇග්නස් තරුණිය නොසෙල්වී ජේසුතුමා වෙත සිත සහ දෑත් ඔසවමින් යාච්ඤාවේ යෙදුනා මිස, ඒ අදම්ටුවනට කීකරු වුයේ නැත.




ආණ්ඩුකාරයාගේ තරුණ පුත්‍රයා පැමිණ මේ සියලු වද හිංසාවලින් ඇය ගලවන බවට පොරොන්දු වී තමා සමඟ විවාහ වන ලෙස ඇයගෙන් නැවත නැවත ඉල්ලා සිටියේය. එහෙත් ඇග්නස් පිළිතුරු දෙමින් ''මගේ ගැලවුම්කාර ජේසුස් ක්‍රිස්තුන් වහන්සේට පමණක් මා අයිතිය''යි කීවාය. ඇගේ වදන් ඇසූ ආණ්ඩුකාරයාගේ පුත්‍රයා ඇය මරණයට අණ කළේය. මෙම දිරිමත් තරුණිය ඉදිරියේ සිටි සොල්දාදුවා එක් කඩුපහරින් ඇය මරණයට පත් කළේය. ඇය අන්තිමය දක්වා ජේසු සමිඳුන් වෙත විශ්වාස වන්තව සිටියාය.

ඇගේ මෘත ශරීරය රෝමයෙන් පිට ඇගේ පවුලේ සොහොනෙහි තැම්පත් කළ අතර, එය දැන් ඇගේ නම දරණ බිංගෙයකි. අදත් ඇග්නස් නමින් බැටළු පට්ටියක් වෙනම වෙසෙන අතර, ඇගේ මංගල්‍යය දින දී මෙම බැටළු විශේෂය ආසිරි ගන්වන අතර මෙම බැටළු පට්ටියේ ලොම් වලින් අගරදගුරු හිමිවරු පළඳින පල්ලියුම් පළඳනාව සාදනු ලබයි.

ඇගේ මංගල්‍යය ජනවාරි 21 වන දින සමරයි.

**අසේල දසනායක**

# ප්‍රහේළිකා අංක 35



සැකසුම

තිළිණි දුතිකා පෙරේරා

හරහට

1. මංගලම් කීමට පැමිණි ගාබ්‍රියෙල් දේවදූතයාට මරිය තුමිය පැවසුවේ ''බලන්න මම ස්වාමින් වහන්සේගේ ..... වෙමි. ඔබ පැවසූ ලෙස මට සිදු වේවා'යි යනුවෙනි. මෙහි හිස්තැනට සුදුසු වචනය.

3. ........... වරදවා ගැනීම , පය ලිස්සා වැටීමට වඩා අයහපත්ය'' යනුවෙන් උපදේශකයා හෙවත් සිරාක් පවසයි.

4. මරියතුමියගේ උදන ගීතයේ මෙසේ සඳහන් වේ. සමිඳාණෝ මහා නරපතීන් සිය සිහසුන්වලින් ....හෙලා දීනයන් ඉහල නංවා උසස් කළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය

5. ක්‍රිස්තුන් වහන්සේ සුවකළ ලාදුරු රෝගීන් දස දෙනාගෙන් උන්වහන්සේට ස්තුති කිරීමට නොපැමිණි සංඛ්‍යාව

7. මෙහි ඉඩකඩ නොමැති වූයෙන් ජේසු බිළිඳුගේ උපත සිදු වූයේ ගවලෙනකය.

පහළට

1. මරිය තුමිය දේව මාතාවන් ලෙස තෝරා ගන්නා විට එතුමිය .....රජ පරපුරෙන් පැවත එන ජුසේතුමා හට විවාහ ගිවිසුම් දී සිටියාය. මෙහි හිස්තැනට සුදුසු වචනය

2. මරිය තුමියගේ උදන ගීයේ මෙසේ සඳහන් වේ සමිඳාණන් සාගිනි වුවන්.... දෙයින් සතප්වා ධනවතුන් හිස් අතින් හරවා යැවූ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය

3. ස්නාවක ජුවාම් තුමාගේ එක් දේශනයකදී මෙසේ ප්‍රකාශ කළේය. ....... හොඳ හැටි පිරිසිදු කරන පිණිසත් ධාන්‍ය පෙළා සිය අටුවෙහි රැස්කරන පිණිසත් ක්‍රිස්තුන් වහන්සේ අතේ කුල්ල ඇත. මෙහි හිස්තැනට සුදුසු වචනය

5. ස්නාවක ජුවාම් තුමා උපදින විට සකරියස්තුමා ගොළු ව සිටිය බැවින් තම පුත්‍රයාට දිය යුතු ......... ගල්ලෑල්ලක ලියා පෙන්වූ බව ශු. බයිබලයේ සඳහන් වේ. මෙහි හිස්තැනට සුදුසු වචනය

6. අප ලෝකයේ ආලෝකය විය යුතු බවත් මිනිස්සු පහනක් දල්වා බඳුනක් ..... නොව පහන් රුකක් මත තබා සියල්ලන්ට එලිය ලබා දෙන බව ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක.

**(මෙම ප්‍රහේළිකාව පිරවීමේදී පහත සඳහන් බයිබල් පාඨ උපයෝගී කරගත හැකිය. ශු. ලූක් 1,2,3,4, 17, 19, උපදේශකයා හෙවත් සිරාක් 20, ශු. මතෙව් 5 )**

**06 පිටුවෙන්...**

## 2013 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ......

11. ආදි පීතෘ ආබ්‍රහම්ගේ ජීවිතයේ පිලිඹිබු වූ විශේෂිත ලක්ෂණ 4. කුමක්ද? (2009 /01/1)

12. දෙවියන් වහන්සේ මිනිසාට අනාවරණය වූ ආකාර දෙකක් ලියන්න 2009 /01/ 111

13. දෙවියන් වහන්සේ ආබ්‍රහම්ට දෙන ලද පොරොන්දු දෙකක් ලියන්න (2010/01/1)

14. ඉශ්‍රායෙල් ජනතාව පොරොන්දු දේශයට යන ගමනේදී දෙවියන් වහන්සේ ඔවුන් පෝෂණය කළ ආහාරයත්, නව ගිවිසුමේ ක්‍රිස්තුන් වහ්සේ ස්ථාපිත කළ භෝජනයත් වෙන් වෙන්ව නම් කරන්න. (2010 - 01 - 11)

15. දෙවියන් වහන්සේ තම ප්‍රත්‍රයාණන්ගේ ''පුත්‍රභාවය'' හෙළි කළ අවස්ථා දෙකක් ලියන්න (2010/01/111)

16. ජේසුස් වහන්සේ රෝගීන් සුව කළ ආකාර දෙකක් ලියන්න (2010/01/Iv)

17. මෙරට පෘතුගීසි යුගයේදී ධර්මදූත සේවාව සඳහා පැමිණි පළමු ධර්මදූත කණ්ඩායම් දෙකක් නම් කරන්න. (2010/01/X)

18. උත්පත්ති පොතේ පළමු පරිච්ඡේදයේ සඳහන් ආකාරයට දෙවියන් වහන්සේ මිනිසාට අණ කළේ කුමක්ද? (2011/01/1)


19. දිවැසිවරුන්ට පැවරුණු ප්‍රධාන කාර්ය දෙකක් සඳහන් කරන්න. (2011/01/11)

20. ඇඳහිල්ල වර්ධනය කර ගැනීම සඳහා කළ යුතු කාර්ය දෙකක් ලියන්න. (2011/01/111)

### ප්‍රහේළිකාව පුරවා එවීමේදී

- ප්‍රහේළිකා පුරවා එවීමේදි ඔබගේ නම, ලිපිනය, පාසල, දහම් පාසල, ඉගෙනුම ලබන ශ්‍රේණිය හා දුරකතන අංකයද පැහැදිලිව ලියා අප වෙත යොමු කරන්න.
- එක් අයෙකුට ප්‍රහේළිකා පුරවා එවිය හැක්කේ 2 ක් පමණක් බැව් කරුණාවෙන් සලකන්න.
- ඔබ පුරවා එවන ප්‍රහේළිකාව තැපැල් පතක අලවා එවීමද **අනිවාර්ය** බැව් සලකන්න.

**සංස්කාරක පියතුමා**


ආනන්ද කල්දේරා
රචනා කරන
රජ කුමාරයයි කිඳුරු කුමාරියයි
ඉතිං කිඳුරු කුමාරි කුමාරයාව හමුවෙලා කිඳුරු විමානෙට යන්න පිටත් වුනා.. ඔය අතර කිඳුරු රැජිණ කුමාරි ගැන සොයද්දි ආයෙත් කුමාරයා හමුවෙන්න දිය මතුපිටට ගිය බව දැනගන්න ලැබුනා රැජිණ ඒ ගැන කල්පනා කරන්න වුනා....
28
මගෙ කුමාරි මේ තරම් ආදරේද ඔය මනුස්ස කුමාරයට කුමාරයට මේ වාගෙ ආදරෙන් ඉන්න දෙන්නෙ කව වෙන් කරන එක මහ පාපයක්
ඒ හෙම කල්පනා කළ රැජින මන්ත්‍රකාරිය හමුවී...
මගෙ දුව කුමාරයට හරිම ආදරෙන් ඉන්නෙ... අපි කුමාරිව කුමාරයට.. ...විවාහ කරල දෙමු..
ඒත් රැජිණියෙනි කුමාරයා කොහොමද එයාලගෙ ලෝකෙට කුමාරිව ගෙනියන්නෙ.. කෝ කුමාරිට කකුල්.. වරල්නෙ තියෙන්නෙ..
මන්ත්‍රකාරිය... ඔබගේ මායා බලයට කරන්න බැරි දෙයක් නැහැනෙ.. ඔබ කුමාරිව මනුස්ස දුවක් බවට පත්කරන්න ඕනි
අපි කුමාරි විමානෙට ආවහම ඒ ගැන කියල කුමාරිගෙයි කුමාරයා ගෙයි මංගල්ලෙට ඔක්කොම සූදානම් කරමු....
හොඳයි රැජිණියනි...
මේ කිසිත් නොදත් කුමාරියි; මන්ත්‍රකාරිගෙ දුවයි කිඳුරු විමානෙ මාළිගාවට ආවා..
කුමාරි බොහොම ඉන්න ඔයා අදත් මට හොරා කියයි.. ඒත් මම දන්නව ඔයා ඊයෙ රාත්‍රී කුමාරයාව බලන්න ගියා කියල....

# ශු. ප්‍රැන්සිස් මුණිඳුන්ගේ කතාව

# අසීසි නගරයේ දිළින්දා

ඉදිරිපත් කිරීම - ආමල් ද සිල්වා

06

